# පැළෑටි හා ගස්වැල්.

## පාඩම් අංක 03.

01. පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1. ශාකයක් පොළොව හා සම්බන්ධ වන ශාකයේ ඇති ප්‍රධාන කොටස කුමක් ද?
2. ගසක මුල්වලින් කෙරෙන කාර්යයන් දෙකක් ලියන්න.
3. තද අරටුවක් සහිත ශාක වර්ග 5ක් ලියන්න.
4. අතු බෙදී ඇති ශාකවලට උදාහරණ 4ක් ලියන්න.
5. අතු බෙදී නැති ශාකවලට උදාහරණ 4ක් ලියන්න.
6. මොළොක් කඳක් ඇති ශාකවලට උදාහරණ 4ක් ලියන්න.
7. ගෙඩි වශයෙන් ඵලය දැකිය හැකි ශාක වර්ග 4ක් ලියන්න.
8. කරල් වශයෙන් ඵලය දැකිය හැකි ශාක වර්ග 4ක් ලියන්න.
9. සතුන්ගේ ඇඟේ ඇලී ව්‍යාප්ත වන බීජ වර්ග 4ක් ලියන්න.
10. පිපිරීමෙන් ව්‍යාප්ත වන බීජ වර්ග 4ක් ලියන්න.
11. සුළඟ මගින් ව්‍යාප්ත වන බීජ වර්ග 4ක් ලියන්න.
12. ජලයේ පාවී ව්‍යාප්ත වන බීජ වර්ග 4ක් ලියන්න.
13. විශාල බීජ ප්‍රමාණයක් සහිත ඵල වර්ග 4ක් නම් කරන්න.
14. තනි බීජයක් සහිත ඵල වර්ග 4ක් නම් කරන්න.
15. ගස් සිටුවීමෙන් අපට ලබාගත හැකි වාසි 4ක් ලියන්න.

02. හිස්තැනට ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. වියළි ප්‍රදේශවල වැඩෙන ශාකවල පත්‍ර .......................... (කුඩා/විශාල) ස්වභාවයක් ගනියි.
2. කඩොලාන යනු .......................... (කඳු/ජලය) ආශ්‍රිතව වැඩෙන ශාක විශේෂයකි.
3. ගසක වැඩිපුර මල් හට ගන්නේ හොඳින් හිරුඑළිය .......................... (ලැබෙන/නොලැබෙන)

   අතුවලය.
4. පස සෝදායෑම .......................... (අඩුවීම/වැඩිවීම) ගස්වලින් ලැබෙන වාසියකි.
5. හිරු එළියෙන් ආරක්ෂා වීම හා පොහොර ලැබීම ගස්වැල් වලින් ලැබෙන ..........................

   (වාසියකි./අවාසියකි.)

6. බෝංචි කරලක බීජ පිහිටා ඇත්තේ .......................... (රටාවකට වේ./රටාවකට නොවේ.)

7. රබර් බීජයක් වතුරට දැමූවිට .......................... (පාවේ./යට යයි.)

8. .......................... (වංඇපල/කූඩලු) සතුන්ගේ ඇඟේ ඇලී ව්‍යාප්ත වන බීජවලට උදාහරණයකි.

9. මදටිය බීජයේ පැහැය .......................... (කලු/රතු) පාටින් යුක්තය.

10. අලිගැටපේර යනු බීජ .......................... (එකක්/බොහොමයක්) පිහිටි ඵලයකි.

11. .......................... (තල්ගස/කෙසෙල් ගස) කාල වර්ගයට අයත් ගස්වලට උදාහරණයකි.

12. .......................... (බිං කොහොඹ/වැටහිර) ශාකය ලංකාවට ඒක දේශික ශාකයකි.

13. .......................... (වට්ටක්කා/වෙරලු) ගෙඩිය බවට පත්වූ කොටස මල්පෙතිවලට පහලින් පිහිටා ඇති ඵලයකි.

14. මුදුන් මුලක් සහිත ශාකයක් ලෙස .......................... (මොනර කුඩුම්බිය/තුත්තිරි) ශාකය දැක්විය හැක.

15. ගසක සෑදෙන කරලක් ලෙස .......................... (මුරුංගා/කරවිල) දැක්විය හැක.

03. පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. කාල නියමයක් නැතිව මල් පිපෙන ශාක දෙකකි.

(I) අඹ, කෝපි (II) පොල්, පුවක් (III) මැයි, රඹුටන්

2. මල් නොපිපෙන ශාකයකි.

(I) තල් (II) මීවන (III) කෝමාරිකා

3. දඬු කැබලි මඟින් පැළ ලබා ගන්නා බෝගයකි.

(I) මිරිස් (II) බතල (III) රඹුටන්

4. අතුවල මෙන්ම කඳෙහි ගෙඩි හටගන්නා ශාකයකි.

(I) වෙරලු (II) පොල් (III) කොස්

5. මංශ භක්ෂක ශාකයක් නොවේ.

(I) බාඳුරා (II) නිල් මොනරස්ස (III) කූඩලු

6. හවස් කාලයේ මල් පිපෙන ශාකයකි.

(I) කූඩලු (II) වැටකොළු (III) කඩුපුල්

7. සෙවණේ වැඩීමට කැමති ශාකයකි.

(I) බෝගන්විලා (II) ගොයම් (III) ඇන්තූරියම්

8. පෙති හතරක් ඇති මලකි.

(I) අරලිය (II) වද (III) නා

9. ජලයේ පිපෙන මල්වර්ගයක් නොවේ.

(I) කෙකටිය (II) සේපාලිකා (III) මානෙල්

10. පිපිරීමෙන් බීජ ව්‍යාප්ත වන ශාකයකි.

(I) නාගදරන (II) කජු (III) රබර්

11. වසරේ එක් කාලයකට පමණක් මල් පිපෙන ශාකයකි.

(I) සල් (II) බිනර (III) කිතුල්

12. කරල් හටගන්නා වැලක් නොවේ.

(I) මෑ (II) දඹල (III) බණ්ඩක්කා

13. බීජ හා අතු යන වර්ග දෙකෙන් ම පැළවන ශාකයකි.

(I) නිවිති (II) මිරිස් (III) කරවිල

14. ජලජ පැළෑටියක් ලෙස ගත නොහැක.

(I) හයිඩ්‍රිල්ලා (II) කෙකටිය (III) උඩවැඩියා

15. කඳෙහි ආහාර ගබඩා කර ඇති ශාකයකි.

(I) බිලිං (II) උක් (III) උඩවැඩියා

16. පුස්කොළ පොත් සෑදීමට යොදා ගන්නා ශාකය වන්නේ,

(I) පොල් (II) කිතුල් (III) තල්

17. ඒක දේශික ශාකයකි.

(I) රබර් (II) තේ (III) ගොඩපර

18. බත්ගස ලෙස හඳුන්වන ශාකය වන්නේ,

(I) පොල් ගස (II) කොස්ගස (III) ගොයම් ගස

19. ඵලය හෝ බීජය වෙනම පිහිටි පලතුරකි.

(I) නාරං (II) කජු (III) මැංගුස්

20. කෝමාරිකා ශාකය බහුලව යොදා ගන්නේ,

(I) උදරාබාධ වලදී (II) පළිස්සුම් තුවාල වලදී (III) හිසරදයක දී

21. දැති සහිත ශාක පත්‍රයක් නොවේ,

(I) කොහොඹ (II) දහස්පෙතියා (III) නා

22. පඳුරු ලෙස වැඩෙන ශාක වර්ගයකි.

(I) වද (II) උණ (III) රඹුටන්

23. දුගඳ හමන මල් වර්ගයක් වන්නේ,

(I) තල්මල (II) කිඩාරම් මල (III) සල්මල

24. අතු බෙදෙන ශාකවල දැකිය හැක්කේ,

(I) තන්තු මුල් (II) මුදුන්මුල් (III) කුඩා මුල්

25. මෙරටට ආවේණික වූ ඒකදේශික වැල්වර්ගයකි.

(I) ගොඩපර (II) කෙකටිය (III) මා වේවැල්

ප්‍රදීප් කුමාර

කෑ/මාව/ අශෝක ප්‍රා.වි.

මාවනැල්ල අධ්‍යාපන කලාපය